# ENTREPRENEURSHIP

# (Part-II)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# ව්‍යවසායකත්ව ක්‍රියාවලිය

ව්‍යාපාරික අවස්ථා උදාකර ගැනීමත්, ඒවා ප්‍රයෝජනයට ගැනීම සඳහා සංවිධාන නිර්මාණය කිරීමත් යනා දී කටයුතුවල දී සිදු කරන්නට යෙදෙන සියලු ම ක්‍රියාවන් ව්‍යවසායකත්ව ක්‍රියාවලිය ලෙස හැඳින්වේ.

# ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර

- නව්‍යතා සොයා ගැනීම (Discovery)
- සංකල්ප ගොඩනැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම
  (Concept development & preparing business plan)
- අවශ්‍ය සම්පත් සම්පාදනය (Resourcing)
- යථාර්ථයක් බවට පත් කිරීම (Actualization )
- ප්‍රතිලාභ ලැබීම ( Harvesting )

ClassWork.LK

# ව්‍යවසායකත්ව ක්‍රියාවලිය රූප සටහනකින්

නව්‍යතා සොයා ගැනීම
Discovery

↓

සංකල්ප ගොඩනැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම
Concept development & preparing business plan

↓

අවශ්‍ය සම්පත් සම්පාදනය
Resourcing

↓

යථාර්ථයක් බවට පත්කර ගැනීම
Actualization

↓

ප්‍රතිලාභ ලැබීම
Harvesting

ClassWork.LK

## 1 පියවර - නව්‍යතා සම්පාදනය

ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ ප්‍රථම අදියරේ දී ව්‍යවසායකයා විසින් අදහස් ජනනය කර ගැනීමත්, පරිසර අධ්‍යයනය තුළින් අවස්ථා හඳුනා ගැනීමත්, වෙළෙඳපොළ අධ්‍යයනය කිරීමත් සිදු කරයි.

## 2 පියවර - සංකල්ප ගොඩනැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම

මෙම අදියරේ දී ව්‍යාපාර සැලැස්මක් සකස් කෙරේ. එමගින් ව්‍යාපාර අදහස පැහැදිලි කෙරෙන විස්තරාත්මක වැඩපිළිවෙලක් ඉදිරිපත් කෙරේ.

## 3 පියවර - අවශ්‍ය සම්පත් සම්පාදනය

මෙම අදියරේ දී ව්‍යවසායකයා විසින් ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය, මානව සහ භෞතික සම්පත් හඳුනා ගන්නා අතර, ඒවා අත්කර ගැනීමට කටයුතු කරයි.

## 4 පියවර - යථාර්ථයක් බවට පත් කිරීම

මෙම අදියරේ දී ව්‍යවසායකයා ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු සිදු කරන අතර,ව්‍යාපාර අරමුණු ඉටු කර ගැනීම සඳහා සම්පත් උපයෝගී කරගනී.

ClassWork.LK

# 5 පියවර - ප්‍රතිලාභ ලැබීම

ව්‍යාපාරයේ අනාගත වර්ධනය හා සංවර්ධනය පිළිබඳ තීරණ ගැනීම ව්‍යවසායකයා සිදු කරන්නේ මෙම අදියරේ දී ය.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura